සැ. යු. — මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2014/2015 වර්ෂය සඳහා කෑගල්ල අධිකරණ කළාපයට අයත් ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය මෙම ගැසට් අංකය හා එයට අදාළ පළ කරන දිනය යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,906 - 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2015.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 584 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 605 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 02 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

583 - B 80929— 5,302 (2015/03 )
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## දඹුල්ල මහ නගර සභාව

දඹුල්ල මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත සඳහන් කරුණුවලට අදාළ අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, දඹුල්ල මහ නගර සභාව" යන ලිපිනයට 2015.03.30 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | 13 | රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (06/2006 (iv) අනුව PLI-2006 A | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරක දී සමත් වී තිබිය යුතුය. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 08 | රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (06/2006 (iv) අනුව PLI-2006 A | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරක දී සමත් වී තිබිය යුතුය. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(i) අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) තෝරාගනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

06. *වෙනත් පොදු කොන්දේසි :-*

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු අතර, රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.
(v) දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ වසර 03ක පදිංචිය සනාථ කිරීමට ග්‍රාම සේවා වසමේ ග්‍රාම නිලධාරිගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

07. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් අයදුම්පත් 2015.03.30 වැනි දිනට හෝ එදිනට පෙර නාගරික කොමසාරිස්, මහ නගර සභාව, දඹුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

(දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.)

08. අයදුම්පත සමග පහත සඳහන් සහතික වල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්, (එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
(v) වෘත්තීය පිළිබඳ සහතික තිබේ නම් එම සහතික :
(vi) සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි)

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදිය බලතල දඹුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

අමිල නවරත්න,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
දඹුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දඹුල්ල මහා නගර සභාවේ.......................... තනතුරට බඳවා ගැනීම**

01. *(අ)* මුලකුරු සමග නම :——————————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
02. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
*(ආ)* ස්ථිර පදිංචි ලිපිනය:——————————.
03. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
04. *(අ)* උපන් දිනය : ——————————.
*(ආ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස:
අවුරුදු:——————. මාස:——————. දින:——————.
05. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
06. විවාහක/අවිවාහක බව:——————————.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද? :——————————.
08. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? එසේ නම් ඒ විස්තර:——————————.
09. අධ්‍යාපන සුදුසුකම්:——————————.

| අ.පො.ස. (සා.පෙළ) විභාගය | | අ.පොස. (උ.පෙළ) විභාගය | |
|---|---|---|---|
| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. වෘත්තීමය සුදුසුකම් හා පළපුරුද්ද :——————————.
11. ඔබ දැනටමත් මෙහි ආදේශකව සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/දීමනා/ආදේශක ද යන වග):——————————.
12. වෙනත් සුදුසුකම් :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරුවලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

03-228

## තංගල්ල නගර සභාව

2014.12.05 දින පළකරන ලද ගැසට් නිවේදනය හා 2015.01.09 දින පළකරන ලද සංශෝධන නිවේදනය මෙයින් අවලංගු වේ.

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

තංගල්ල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් තංගල්ල නගර සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික හා සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

#### උපලේඛනය

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් බේත අංකය | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. රියදුරු (III පන්තිය) | 08 | PL 3/2006A | රු. 12,470- 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,860 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය ඕනෑම විෂයන් 06ක් සමත්ව තිබිය යුතුය.<br><br>ලොරි/ට්‍රැක්ටර්/අත් ට්‍රැක්ටර්/ජල බවුසර්/ගලි බවුසර්/බර වාහන රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීම පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>බලපත්‍රය ලැබීමෙන් පසු වාහන යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 02. බර යන්ත්‍ර ක්‍රියාකරු (III) පන්තිය | 01 | PL 3/2006A | රු. 12,470- 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,860 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය ඕනෑම විෂයන් 06ක් සමත්ව තිබිය යුතුය.<br><br>බර වාහන රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීම පිළිබඳ බලපත්‍රයක් හා ලබා තිබීම ;<br>*සහ*<br>බැකෝ යන්ත්‍ර/ස්කැවේටර්/මෝටර් ගේඩර් බර වාහන රථ ක්‍රියාකරවීම සම්බන්ධයෙන් රජයේ පිළිගත් ආයතනයක සහතිකය ලබා තිබිය යුතු ය.<br><br>බලපත්‍රය ලැබීමෙන් පසු යන්ත්‍ර ක්‍රියා කරුවන් වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 03. විදුලි කාර්මික (III පන්තිය) | 01 | PL 2/2006A | රු. 12,210- 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,600 (හතරවන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සමත්ව තිබිය යුතුය.<br><br>විදුලි කාර්මික තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා ගැනීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 04. වඩු කාර්මික (III පන්තිය) | 01 | PL 2/2006A | රු. 12,210- 10 x 130 - 10 x 1,45 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (හතරවන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය.<br><br>වඩු කාර්මික තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා ගැනීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 05. පෙදරේරු (III පන්තිය) | 01 | PL 2/2006A | රු. 12,210- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (හතරවන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය.<br><br>පෙදරේරු තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා ගැනීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 06. කා.කා.ස (III පන්තිය) | 03 | PL 1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 x 145 x 10 - 160 x 12 රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම). | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය. |
| 07. සෞඛ්‍ය කම්කරු (III පන්තිය) | 03 | PL 1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම). | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |
| 08. වැඩ/ක්ෂේත්‍ර කම්කරු (III පන්තිය) | 03 | PL 1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම). | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |
| 09. ක්‍රීඩාංගන භාරකරු (III පන්තිය) | 01 | PL 1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 x 160 x 12 රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම). | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිත විෂයයන් 06ක් සමත්ව තිබීම. |
| 10. සුසානභූමි භාරකරු (III පන්තිය) | 01 | PL 1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම). | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිත විෂයයන් 06ක් සමත්ව තිබීම. |

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් ඛේත අංකය | වැටුප් පරිමාණය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 11. සෞඛ්‍ය කම්කරු (III පන්තිය) (ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය) | 08 | PL 1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 රු. 17,600 (හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා පොදු කොන්දේසි :*

01. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාවය මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තාවූ හෝ සිය තනතුර ඇතහැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතු ය.

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතු ය.

03. යම් අපරාධ නීති කෘත්‍යයක දී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයක දී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතු ය.

04. වස්තු භංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතු ය.

05. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

06. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

07. 2015.03.27 වැනි දිනට වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමැතිය තබා පදිංචිය සනාථ කළ හැකි වේ.)

09. මෙම බඳවාගැනීම අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී හෝ ඊට පසුව හෝ අතරමගදී හෝ අතහැර දැමීමට තංගල්ල නගර සභාවට බලය ඇත.

*විශේෂ සුදුසුකම්:*

01. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

02. රියදුරු හා බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර හැර අනෙක් තනතුරු සඳහා ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන්ට රියදුරු බලපත්‍රය තිබීම.

03. විදුලි කාර්මික තනතුර හැර අනෙක් තනතුරු සඳහා ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන්ට විදුලි කාර්මික දැනීම තිබීම. ඉලෙක්ට්‍රෝනික යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ දැනුම, පරිඝනක ක්‍රියාකරවීම හෝ දුරකථන පද්ධති අලුත්වැඩියාව පිළිබඳ දැනුම, නීති හා ආපදා වලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ දැනුම, උද්‍යාන අලංකරණය පිළිබඳ දැනුම, කලා කටයුතු පිළිබඳ දැනුම, ෆැක්ස්, ඡායාපිටපත්, මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම පිළිබඳ දැනුම හෝ වෙනත් විශේෂ දැනුම තිබීම.

4. දැනටමත් තංගල්ල නගර සභාවේ වැටුප් ලබමින් තංගල්ල නගර සභාවේ සේවය කිරීම.

මෙම විශේෂ සුදුසුකම් සම්පූර්ණ කරන අයට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

*සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
02. රජයේ ප්‍රතිපත්තිවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන රීති හා නියෝගවලට ද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ, උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද, ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද, තංගල්ල නගර සභාව විසින් කරනු ලබන නියෝගවලට ද, අනුකූලව ක්‍රියාකිරීමට බැඳී සිටිය යුතුයි.
03. රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුව ඇප තැබිය යුතු ය.
04. රජයේ ප්‍රතිපත්තිවලට අදාළව නියම කරනු ලබන භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු ය.
05. බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව තහවුරු වුවහොත් පත්වීම් අහෝසි කරනු ලැබේ.

06. බඳවාගනු ලබන සේවකයින් ස්ථාන මාරුකිරීම්වලට යටත් වේ.
07. පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නොවන සේවකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2015.03.27 වැනි දිනට පෙර ලැබෙන සේ "සභාපති, තංගල්ල නගර සභාව, තංගල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එසේ නොමැති නම් තංගල්ල නගර සභාවේ ලේකම් වෙත අතින් භාරදී එය භාරදුන් බව සනාථ කරගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස කෙළවරේ ................................ (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතු ය.

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අනිල් සෙල්ලාහැන්නදි,
සභාපති,
තංගල්ල නගර සභාව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*තංගල්ල නගර සභාව*

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම - 2014 වර්ෂය*
*............................................. තනතුර*

01. (**අ**) මුලකුරු සමග නම : ———— ;
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම : ———— ;
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ———— ;
03. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ———— ;
04. ස්ථිර ලිපිනය : ———— ;
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ———— ;
06. විවාහක/අවිවාහක බව : ———— ;
07. උපන් දිනය : ———— ;
2015.03.27 වැනි දිනට වයස : අවු : ———— ; මාස : ———— ; දින : ———— ;
08. ජාතික හැඳුනුම්පත් අංකය : ———— ;
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන්ද? : ———— ;
10. අධ්‍යාපන සුදුසුකම් : ———— ;
11. වෙනත් සුදුසුකම් : ———— ;
12. වෘත්තීය සුදුසුකම් : ———— ;
13. විශේෂ සුදුසුකම් : ———— ;
14. සේවා පළපුරුද්ද : ———— ;
(I) දැනට සේවය කරන ආයතනය : ———— ;
(II) දැනට දරන තනතුර : ———— ;
(III) එම තනතුරට පත්වූ දිනය : ———— ;
(IV) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුරු : ———— ;
15. අයදුම්කරු සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු වී ඇත්ද ? දඬුවම් ලබා ඇත්ද ? : ———— ;
16. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මා තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බව මම දනිමි.

..............................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ...........................................

දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරුවන ................................................ .......................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

.....................................
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ හෝ
බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම : ———— .
පදවි නාමය : ———— .
ආයතනය : ———— .
දිනය : ———— .

03 - 525

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.(කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුක්ත අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2015.03.27 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහායක III | 02 | PL I-2006A<br>රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600<br>(7 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එකවර කවර හෝ විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය;
(2) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය;
(3) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත.) ;
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය;
(5) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික ලිඛිත පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරනු ලැබේ;

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(2) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල සහතිකකල පිටපත් එවිය යුතු ය.

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතිකය,
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(4) මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය,
(5) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්,
(6) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*04. අයදුම්කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2015.03.27 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.
(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතු ය.
(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැළකිය යුතුයි :** මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොට්ටාවත්ත මුල්ලේරියා ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්. ඩී. ෆ්‍රැන්සිස්කා,
ලේකම්,
කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත -මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

(1) *(අ)* මුලකුරු සමග නම :——————————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
(3) ස්ථිර ලිපිනය:——————————.
(4) (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ?:——————————.
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද ?:——————————.
(5) ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
(6) ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
(7) විවාහක/අවිවාහක භාවය:——————————.
(8) දුරකථන අංකය:——————————.
(9) උපන් දිනය:
වර්ෂය :——————————.මාසය:——————————. දිනය:——————————.
(9) 2015.03.27 දිනට වයස:
අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
(10) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):——————————.
(11) වෘත්තීය සුදුසුකම්:——————————.
(12) සේවා පළපුරුද්ද:——————————.
(13) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :——————————.
(14) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්කරු වන ............................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————————.
පදවි නාමය:——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය:——————————.

03-371

## මිනුවන්ගොඩ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### *උපලේඛනය*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | ආදායම් පරීක්ෂක III කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණය | 01 | MN1/2006A | රු. 13,120 - 10 x 145- 11 x 170 - 10 x 240 - 10 x 320 රු. 22,040 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉම) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින්(06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වී තිබීම සහ අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. බඳවා ගැනීම ලිඛිත පරීක්ෂණයක් මගින් ලබා ගන්නා කුසලතාවය මත) |
| 02. | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු (කා.සේ. සේ. III) | 03 | PL1/2006A | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 රු. 17,600 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතුය. |
| 03. | සෞඛ්‍ය කම්කරු (කා.සේ. සේ. III) | 02 | PL1/2006A | රු. 11,730 - 120 x 10 -130 x 10 - 145 x 10 - 160 x 12 රු. 17,600 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 04. | බර උපකරණ ක්‍රියාකරු | 01 | PL2/2006A | රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | *බාහිර අයදුම්කරුවන් සඳහා*<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම, තනතුරට අදාළව අවම වශයෙන් අවුරුදු 02ක පළපුරුද්දක් ලබා තිබීම<br>සහ ගල් රෝල, බැකෝ යන්ත්‍ර ක්‍රියා කරවීම සම්බන්ධයෙන් රජයේ පිළිගත් ආයතනයක සහතිකය.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br>අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම හා අදාළ තනතුරේ වසර 02ක පළපුරුද්දක් ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. |

*(අ) පොදු සුදුසුකම් :*

01. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.
02. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
03. අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස බලපානු නොලැබේ.)

05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

*03. බඳවා ගැනීම හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. නියම කරනු ලබන ප්‍රතිශතයකින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
03. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.
04. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වාචික පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

*04. සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාතේ සභාවේ මුදල් රෙගුලාසි වලටද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මීනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2015.04.17 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, නගර සභාව, මීනුවන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තවද අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතිකය,
(iii) ග්‍රාම නිලධාරි සහතිකය,
(iv) පළපුරුද්ද පිළිබඳ සහතිකය,
(v) චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේදී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියලු බලතල මීනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සතුවේ

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම්,
නගර සභාව, මීනුවන්ගොඩ.

2015 පෙබරවාරි මස 20 වැනි දින,
මීනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ - මීනුවන්ගොඩ නගර සභාවේ***
***............. තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය***

01. *(i)* මුලකුරු සමග නම :——————————.
*(ii)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
03. ස්ථිර ලිපිනය :——————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
06. උපන් දිනය :
අවුරුද්ද:——————————. මාසය:——————————. දිනය :——————————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු:——————————. මාස:——————————. දින :——————————.
08. විවාහක/අවිවාහක බව :——————————.
09. ශ්‍රීලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුය):——————————.

11. රියදුරු බලපත්‍රයේ වර්ගය සහ අංකය (රියදුරු තනතුර සඳහා අදාළවේ) :——————.

12. *(i)* වෙනත් සුදුසුකම් :————.

*(ii)* වෘත්තීය සුදුසුකම්:————.

*(iii)* සේවා පළපුරුද්ද:————.

13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර:————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :————.
එම තනතුරට පත් වූ දිනය:————.

14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?:————.

මෙම අයදුම්පතෙ හි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

03-227

---

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු තනතුර සහ ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ :-

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය සහ වැටුප් කෙත් අංකය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ක්ෂේත්‍ර කම්කරු (කාර්යාල සේවක සේවය III ශ්‍රේණිය) | 06 | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 PL1-2006A (4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | අවම වශයෙන් 5 වන ශ්‍රේණිය/6 වසර සමත්වී තිබිය යුතුය. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 02 | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 PL1-2006A (4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :-*

1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
2. යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතුය.
4. ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය. දැනටමත් සේවයේ යෙදී සිටින සේවක අයට මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
5. ඉහත දක්වා ඇති තනතුරට අදාළව ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
6. බඳවා ගැනීමේ පටිපාටියට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී ලබාගන්නා ඉහලම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
7. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාල පරිදි වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවාගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතු ය.

මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, දපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාතේ පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක (අංක 01 සිට 10 දක්වා එක පැත්තක ද, අංක 11 සිට ඉදිරියට අනෙක් පැත්ත ද) වනසේ කඩදාසියේ දෙපැත්තේ අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කොට 2015.04.02 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම් දොම්පෙ ප්‍රාදේශීය සභාව කිරිදිවැල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු ය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික පිටපත් අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය ;
ii. ජාතික හැඳුනුම්පත ;
iii. අධ්‍යාපන සහතික හෝ ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික;
iv. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය ;
v. සේවා සුදුසුකම් දැක්වෙන සහතිකය ;
vi. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික .

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 25 වැනි දින,
කිරිදිවැල,
දොම්පෙ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ............................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) මුලකුරු සමග නම :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
03. ස්ථිර ලිපිනය :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. උපන් දිනය : අවුරුද්ද:————. මාසය :————. දිනය :————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
07. විවාහක/අවිවාහක භාවය :————.
08. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු:————. මාස :————. දින :————.
09. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය :————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද? යන වග : ————.

11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :
අ.පො.ස. (සා.පෙළ) විභාගය
*(අ)* සමත් වූ වසර :———. ශ්‍රේණිය:———.
*(ආ)* විභාග අංකය :———. වර්ෂය :———.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

*(ඇ)* අ.පො.ස. (උ.පෙ.) විභාගය :

විභාග අංකය :———. වර්ෂය :———.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

10. වෘත්තීය සුදුසුකම් :———.

11. සේවා පළපුරුද්ද :———.

12. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? තිබේ නම් ඒ පිළිබඳ විස්තර ? :———.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු සපයා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

03-367

---

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | රියැදුරු | 02 | (රා.ප.ච. 6/2006 IV) PL 3-2006A රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 | 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක්වත් සමත්වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර)<br>2. දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබීම ප්‍රමාණවත් වේ.<br>3. තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>4. වාහන රියැදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |

(2) *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කොට සනාථ කර තිබිය යුතුයි.)
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් විය යුතුයි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුයි.

(3) *බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
2. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
4. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

(4) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. සියලුම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
3. බඳවාගනු ලබන තැනැත්තන් වසර 03ක පරිවාස කාලයකට යටත්වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාතේ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

(5) අයදුම්පත් ඉදිරිපත් කිරීම :

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2015.04.10 වැනි දින හෝ ඊට ප්‍රථම " ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.

3. අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතු ය.);
(v) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික. (රජයේ /පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගල්ගමුව.

2015 මාර්තු මස 20 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ රියැදුරු තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර ලිපිනය :——————————,
3. (i) උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————,
(ii) 2015.04.10 දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————,
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————,
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————,
6. විවාහක/අවිවාහක බව :——————————,
7. ජාතිය :——————————,
8. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————————,
9. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————,
10. අධ්‍යාපන සුදුසුකම්(සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————,
(i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————————, වර්ෂය:——————————,
(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————————,
විභාග අංකය :——————————. වර්ෂය:——————————,

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගය :——————————,

විභාග අංකය :——————————, වර්ෂය:——————————,

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————,
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර :——————————,
13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද?

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරා ගනු ලැබුවහොත් සේවයේ මුදාහැරීමට එකඟවන බවත්, දැනට ............................................................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

——————————,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

දිනය :——————————,

03-422

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01. | විදුලි කාර්මික | 01 | (රා.ප.ච. 6/2006 IV) PL 3-2006A රු.12,470-10x130-10x145 10x160-12x170-රු.18,860 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 6ක් වත් සමත්වී තිබිය යුතු ය. අවම වශයෙන් එක් වරක දී විෂයයන් 5ක් වත් සමත්වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනයක් විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N.V.Q.) 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>පළාත් සභා රාජ්‍ය සේවයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය.<br>රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (N.V.Q.) 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම. |

*අවශ්‍ය වෙනත් සුදුසුකම් ః-*

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
02. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
03. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
05. ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/ආදේශක/තාවකාලික කොන්ත්‍රාත් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන සේවක සේවිකාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

*04. සේවා කොන්දේසි ః-*

01. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
03. තෝරාගනු ලබන සේවක/සේවිකාවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසිවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තු හෝ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
05. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු තුනක කාලයක දී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සලකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය ః-*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2015.03.27 වැනි දිනට පෙර "ලේකම්, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

07. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතික;
03. ශිල්පීය නිපුණතා ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය ශිල්පීය හා අර්ධ ශිල්පීය තනතුරු සඳහා ;
04. හැඳුනුම්පත් පිටපතක් ;
05. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය;
06. විදුලි කාර්මිකයකු වශයෙන් වසර 03 පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය;
07. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්

*බඳවා ගැනීමේ ක්‍රමය ః-*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතාව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. එම්. ටී. කේ. රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

2015 පෙබරවාරි මස 16 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ................................................ තනතුර සඳහා වූ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමඟ නම :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. පෞද්ගලික ලිපිනය :——————————.
3. *(අ)* උපන් දිනය:——————————. අවුරුද්ද:——————. මාසය:——————. දිනය:——————.
   *(ආ)* ..................................... දිනට වයස : අවුරුදු:——————. මාස:——————. දින:——————.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :——————————.
5. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————————.
6. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————.
7. විවාහක/අවිවාහක බව :——————————.
8. සමත්ව ඇති ඉහල විභාගය:——————————.
9. ශිල්පීය නිපුණතා :——————————.
10. වෘත්තීය සුදුසුකම් :——————————.
11. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේද ? :——————————.
12. එසේ නම් දඬුවමේ ස්වභාවය :——————————.
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

03-324

---

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව
ආයතනගත තනතුරු සඳහා බඳවා ගැනීම

හම්බන්තොට මහ නගර සභාව

හම්බන්තොට මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(01) දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත මෝටර් රථ රියදුරු සේවය 111 පන්තිය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *පුරප්පාඩු ගණන* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | රියදුරු | 111 ප්‍රාථමික ශිල්පය | 02 | PL 3-2006A<br>රු.12,470-10x130-10x145<br>10x160-12x170-18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය ඕනෑම විෂයයන් 06කින් සමත්වී තිබීම. |

*වෙනත් සුදුසුකම් :-*

පුරප්පාඩු පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් සහ නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. සහ මෝටර් රථ රියදුරන් බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.)

01. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.
(ii) මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලු පත් කිරීම්/බඳවා ගැනීම් දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත මෝටර් රථ රියදුරන් සඳහා වන රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතු ය.
(iii) නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

සංලක්ෂය :

දැනට හම්බන්තොට මහා නගර සභාව තුළ ආදේශක/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අයදුම්කරුවන් කෙරේ වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. (මේ බැව් චර්යා සටහන් මගින් සනාථ කළ යුතුය.)

II) *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය ;
(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්දහිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය;
(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය;
(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.);
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් නොලද අයෙකු විය යුතුය;
(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂාවේදී ශාරීරික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ;
(vi) අයදුම්කරු ඒ තනතුර සඳහා දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලිය යුතු ය.

III.) *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය;
(ii) ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර පත්වීම් ලබා වසර 5ක් තුළ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය;
(iv) මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, දකුණු පළාත් සභාව විසින් වරින් වර පනවන ලද රෙගුලාසිවලටද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමියගේ නිර්දේශවලටද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන අයාතන ප්‍රධානීන්ගේ නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයින් බැඳී සිටී.

02. වැඩ **ක්ෂේත්‍ර කම්කරු 111 පන්තිය**

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | වැඩ ක්ෂේත්‍ර කම්කරු 111 | 111 ශ්‍රේණිය ශිල්පීය නොවන | 05 | PLI-2006 A<br>රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | 9 වන වසර සමත් වී තිබීම හෝ 8 වන වසර සමත් වී තිබීම |

II) *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

සංලක්ෂය :

දැනට හම්බන්තොට මහා නගර සභාව තුළ ආදේශක/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අයදුම්කරුවන් කෙරේ වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. (මේ බැව් චර්යා සටහන් මගින් සනාථ කළ යුතුය.)

II) *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය;

(ii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය ;
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් නොලද අයෙකු විය යුතු ය;
(v) හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. (එලෙස ස්ථිර පදිංචිය සනාථ කළ හැකි ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පිහිටි ආසන්නම පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල අයදුම්කරුවන් කෙරේ අවධානය යොමු කරනු ලැබේ.);
(vi) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාල සීමාව අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමට හම්බන්තොට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට බලය හිමි වේ.

III.) *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. සුදුසුකම් මත බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය;
(ii) ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ;
(iii) තුන්වන වැටුප් පියවරට එළඹීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර පත්වීම් ලබා වසර 5ක් තුළ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය;
(vi) මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, දකුණු පළාත් සභාව විසින් වරින් වර පනවන ලද රෙගුලාසිවලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමියගේ නිර්දේශවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියළු සේවකයින් බැඳී සිටී.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2015.04.04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, හම්බන්තොට මහා නගර සභාව, හම්බන්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතනික ප්‍රධානියා මගින් එවිය යුතු ය. අයදුම්පත්‍ර ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර ඉදිරිපත් කල යුතු ය.) අසම්පූර්ණ අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

I. අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) විභාග ප්‍රතිඵල සහතිකය;
(ඇ) අධ්‍යාපන සහතිකය;
(ඈ) පදිංචිය සනාථ කිරීමේ සහතිකය(ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය.);
(ඉ) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය;
(ඊ) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
(උ) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
(ඌ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
(එ) රියදුරු සඳහා රිය පැදවීම් බලපත්‍රයේ පිටපතක්.

නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව,
හම්බන්තොට.

වැනි දින ..................................................................................
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*දකුණු පළාත් රාජ්‍ය සේවය - හම්බන්තොට මහා නගර සභාව*

.................................................................................................... *තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :——————————————.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.

02. ස්ථිර ලිපිනය :——————————————.

03. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.

*(ආ)* ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.

04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————.

05. *(අ)* උපන් දිනය : ——————————.
*(ආ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස: ——————————.
06. දුරකථන අංකය :
*(අ)* ජංගම : ——————————.
*(ආ)* නිවස: ——————————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
08. විවාහක/අවිවාහක බව:——————————.
09. *(අ)* අධ්‍යාපන සුදුසුකම්: අ.පො.ස. (සා.පෙ.) විභාගය
විභාග අංකය:——————————. වර්ෂය:——————————.

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| | | | | | |

*(ආ)* ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :
10. *(අ)* වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ——————————.
*(ආ)* වෘත්තීය සුදුසුකම් : ——————————.
*(ඇ)* සේවා පළපුරුද්ද: ——————————.
11. රියදුරු සේවය සඳහා :
*(අ)* රියදුරු බලපත්‍රයේ වර්ගය : ——————————.
*(ආ)* රියදුරු බලපත්‍රයේ අංකය : ——————————.
*(ඇ)* රියදුරු බලපත්‍රය නිකුත් කළ දිනය: ——————————.
12. ඔබ දැනටමත් මෙම මහා නගර සභාවේ සේවයේ නියුක්තව සිටී නම්,
*(අ)* දැනට දරන තනතුර : ——————————.
*(ආ)* ස්ථිර/ආදේශක/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ද යන වග: ——————————.
*(ඇ)* එම තනතුරට පත්වූ දිනය: ——————————.
13. ඔබ සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු කර ඇත් ද?
එසේ නම් තොරතුරු : ——————————.
14. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ..................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................... වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරගත හොත් ඔහු/ඇය කුමන ආකාරයෙන් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි.

——————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තු/ආයතන (නිල මුද්‍රාව) :——————————.
දිනය :——————————.

03-327

# පළාත් පාලන නිවේදන

## ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි අංක 56 ලුණුගම්වෙහෙර, නවනගරය යන ග්‍රාම නිලධාරි වසම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව විසින් 2014.09.29 දින පැවති මාසික සභා රැස්වීමේ යෝජනා අංක 04-i යටතේ යෝජනා සම්මත කිරීමෙන් හා ඒ සඳහා හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ හපපා/ඒ/වරි.ඉ/පොදු 2014.12.16 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇති බැවින් ඉහත ග්‍රාම නිලධාරි වසම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. අනුර නිශාන්ත,
සභාපති,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 16 වැනි දින,
ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-241

---

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

### අකුරැස්ස ප්‍රාදේශීය සභා වෙළඳ පොළ ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම

2014 නොවැම්බර් මස 21 වැනි දින පවත්වනු ලැබූ අකුරැස්ස ප්‍රාදේශීය මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව තීරණ අංක 06.01.(vi) යටතේ සභා සම්මත වී ඇති බැව් මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

ඉඳුනිල් ජයවීර,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 22 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන වගන්තිය සමග කියවිය යුතු 126 වන වගන්තියේ (xii) උපවගන්තියේ (ග) කොටස මගින් අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලය ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභාව මගින් පිහිටුවා ඇති අකුරැස්ස බංගම පාර කපිහත්ගොඩවත්ත ඉඩමේ පිහිටි පොදු වෙළඳ පොළ සඳහා වෙළඳ පොළ ප්‍රදේශය වශයෙන් පහත සඳහන් ප්‍රදේශයන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එකී වෙළඳ පොළ ප්‍රදේශය -

අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අකුරැස්ස, බංගම පාර, වරිපනම් අංක 23/1 සිට 31 දක්වා අයත් කපිහත්ගොඩ වත්ත ඉඩමේ පිහිටි පොදු වෙළඳ පොළේ සිට බංගම පාර දෙසට යාකබැද්ද හන්දිය දක්වාත්, දෙනියාය පාර දෙසට ලද්දුව පාලම දක්වාත් මාතර පාර දෙසට යාකබැද්ද හන්දිය දක්වාත් , කඹුරුපිටිය පාර දෙසට නිල්වලා ගඟ දක්වාත්, කරාදුගොඩ පාර දෙසට වරිපනම් අංක 35 සිට 79 දක්වාත්, නව අතුරු මාර්ගය දෙසට යාකබැද්ද හන්දිය දක්වාත්, ඩී. සී. වනිගසේකර මාවත සම්පූර්ණ ඇතුළත් වූ ප්‍රදේශය.

03-225

---

## මීගමුව මහා නගර සභාව

### 2015 වර්ෂයේ අංක 01 පරිපූරක අයවැය ලේඛනය

මීගමුව මහා නගර සභාවේ 2015.03.10 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා 2015 වර්ෂයේ අංක 01 දරන පරිපූරක අයවැය ලේඛනය 2015.03.03 දින සිට දින 07ක් මහජන පරීක්ෂණය සඳහා මෙම කාර්යාලයේ තබා ඇති බව 252 අධිකාරය මහා නගර සභා ආඥා පනතේ 214(බී) යටතේ දැනුම් දෙමි.

ඇන්ටනි ජයවීර,
නගරාධිපති.

මහා නගර සභාව,
මීගමුව.

03-373

---

## මොරටුව මහ නගර සභාව

### පරිපූරක අයවැය ලේඛනය 2015-අංක 1

මහ නගර සභා ආඥාපනෙත් 214.2(ආ) වගන්තිය ප්‍රකාරව 2015 මුදල් වර්ෂය සඳහා වූ මොරටුව මහ නගර සභාවේ පරිපූරක අයවැය ලේඛණය අංක 1, 2015 මාර්තු මස 13 දින සිට දින හතක (07) කාලයක් මහජනතාවට පරික්ෂා කර බැලීම සඳහා මොරටුව මහ නගර සභාවේ නගරාධිපති ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු වන මා විසින් පහත සඳහන් ස්ථානවල තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස් කාර්යාලය මොරටුව
ජනසෙත මහජන පුස්තකාලය - කටුබැද්ද

ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති,
මොරටුව මහ නගර සභාව.

2015 පෙබරවාරි මස 20 වැනි දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

03-218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.